# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 29 දරන
# පාරිභෝගික ණය පනත

---

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 1.55 යි    තැපැල් ගාස්තුව: ශත 75 යි

[සහතිකය සටහන් කළේ 1982 අගෝස්තු මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 16/81

**කුලී සින්නක්කර ගිවිසුම්වල පාර්ශ්වකරුවන්ගේ කාර්ය නිර්ණය කිරීම සහ විධිමත් කිරීම පිණිස ද ඒ සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක වන්නේ ය. **ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.**

2. මේ පනතේ විධිවිධාන, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පසු ශ්‍රී ලංකාවේ ඇති කර ගන්නා ලද සියලු කුලී සින්නක්කර ගිවිසුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. **මේ පනත අදාළ කිරීම.**

### කුලී සින්නක්කර ගිවිසුම් ඇති කර ගැනීම සහ ඒවායේ ඇතුළත් විය යුතු කරුණු

3. (1) බඩු කිසිවක් සම්බන්ධයෙන් යම් කුලී සින්නක්කර ගිවිසුමක් ඇති කර ගැනීමට පෙර එම බඩු අපේක්ෂිත කුලියට ගන්නා විසින් අත්පිට මුදලට මිල දී ගනු ලැබිය හැකි (මේ වගන්තියේ "අත්පිට මිල" යනුවෙන් සඳහන් කරනු ලබන) මිලක් අයිතිකරු විසින් ගිවිසුමෙහි නොවන අන්‍යාකාරයකින් ඒ කුලියට ගන්නා වෙත ලියවිල්ලකින් ප්‍රකාශ කළ යුතු ය: **කුලී සින්නක්කර ගිවිසුම්වලට අදාළ නියමයන්.**

එසේ වුව ද—

(අ) බඩු හෝ ඒ සමාන බඩු කුලියට ගන්නා විසින් පරීක්ෂා කොට ඇත්නම් සහ ඔහු විසින් පරීක්ෂා කරන ලද අවස්ථාවේ දී සමස්තයක් වශයෙන් බඩුවල නැතහොත් බඩු සංයුක්ත වන සියලුම විවිධ භාණ්ඩවල හෝ භාණ්ඩ කට්ටල්වල අත්පිට මිල පැහැදිලිව ප්‍රකාශ කෙරෙන පත්‍රිකා හෝ ලේබල් බඩුවලට අමුණා හෝ බඩු සමග ප්‍රදර්ශනය කරනු ලැබුවේ නම්; හෝ

(ආ) සමස්තයක් වශයෙන් බඩුවල නැතහොත් බඩු සංයුක්ත වන සියලුම විවිධ භාණ්ඩවල හෝ භාණ්ඩ කට්ටල්වල අත්පිට මිල පැහැදිලිව ප්‍රකාශ කරන ලද නාමාවලියකට, මිල ලැයිස්තුවකට හෝ ප්‍රචාරක දැන්වීමකට යොමු කිරීමෙන් කුලියට ගන්නා විසින් බඩු තෝරා ගෙන ඇත්නම්

මේ උපවගන්තියෙන් නියම කරන ලද නියමයන් අනුව ප්‍රමාණවත් ලෙස කටයුතු කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් නියමය අනුව කටයුතු කරනු ලැබ තිබේ නම් මිස, සහ—

2—ඒ 63050 15,850(82/04)

(අ) ගිවිසුම, කුලියට ගන්නා විසින් සහ ගිවිසුමේ වෙනත් සියලු පාර්ශ්වකරුවන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් සාදනු ලැබ අත්සන් කොට ඇත්නම්;

(ආ) ගිවිසුමෙහි—

(i) ගිවිසුම අදාළ බඩුවල කුලී සින්නක්කර මිල සහ ඒවායේ අත්පිට මිල සහ කුලී සින්නක්කර මිල ගෙවනු ලබන එක් එක් වාරිකයේ මුදල් ප්‍රමාණය සහ එක් එක් වාරිකය ගෙවිය යුතු දිනය හෝ දිනය තීරණය කිරීමේ ක්‍රමය පිළිබඳ ප්‍රකාශයක්;

(ii) ගෙවන ලද තැන්පතුව පිළිබඳ ප්‍රකාශයක්; සහ

(iii) ගිවිසුම අදාළ බඩු හඳුනා ගැනීමට ප්‍රමාණවත් බඩු පිළිබඳ ලැයිස්තුවක්

ඇතුළත් නම්;

(ඇ) මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති නියම පරිදි යටත් පිරිසෙයින් ගිවිසුමෙහි ඇතුළත් වෙනත් කරුණු ලෙසම ප්‍රකට දැන්වීමක් ගිවිසුමෙහි ඇතුළත් නම්; සහ

(ඈ) ගිවිසුම ඇති කිරීමේ දින සිට දින දහහතරක් ඇතුළත ගිවිසුමේ පිටපතක් කුලියට ගන්නාට භාර දෙනු ලැබ ඇත් නම් හෝ යවා ඇත්නම්

මිස, කුලී සින්නක්කර ගිවිසුමක් හෝ ගිවිසුමට අදාළ යම් ඇප ගිවිසුමක් හෝ කුලියට ගන්නාගෙන් බඩු ආපසු ලබා ගැනීමට යම් අයිතිවාසිකමක් හෝ බලාත්මක කිරීමට අයිතිකරුවකුට හිමිකම නොතිබිය යුතු අතර කුලී සින්නක්කර ගිවිසුම යටතේ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් කුලියට ගන්නා විසින් දෙන ලද හෝ ගිවිසුමට අදාළ ඇප ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් ඇපකරුවකු විසින් දෙන ලද කිසිම ඇපයක් කුලියට ගන්නාට හෝ ඇපකරුට හෝ විරුද්ධව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

(3) කුලී සින්නක්කර මිලෙහි යම් කොටසක් මුදලින් හෝ චෙක්පත් මගින් හෝ නොවන අන්‍යාකාරයකින් ගෙවනු ලබන හෝ ගෙවනු ලැබිය යුතු අවස්ථාවක, කුලී සින්නක්කර මිලෙහි එම කොටස පිළිබඳ විස්තරයක් කුලී සින්නක්කර ගිවිසුමෙහි ඇතුළත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ හෝ (3) වන උපවගන්තියේ සඳහන් නියමයන් අනුව කටයුතු කිරීමෙහි ලා පැහැර හැරීමක් සිදු වී තිබුණ ද, යම් කුලී සින්නක්කර ගිවිසුමක් බලාත්මක කිරීමට නඩුවක් පවරනු ලැබුවේ යම් අධිකරණයක ද ඒ අධිකරණය ඒ පැහැර හැරීම කුලියට ගන්නාට හානි කර නොවූ බවට සහ ඒ ගිවිසුම බලාත්මක කිරීම නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් සාධාරණ හා යුක්ති යුක්ත බවට සෑහීමට පත් වන්නේ නම්, ඒ ගිවිසුම බලාත්මක කරනු ලැබිය හැකි ය.

## කුලියට ගන්නන් ආරක්ෂා කිරීම

4. (1) සෑම කුලී සින්නක්කර ගිවිසුමක ම— ප්‍රතිඥා භාර සහ කොන්දේසි.

(අ) බඩුවල නිරවුල් සන්තකය කුලියට ගන්නාට තිබිය යුතු බවට හා ඔහු විසින් එය භුක්ති විඳිය යුතු බවට ගම්‍යමාන ප්‍රතිඥා භාරයක් ;

(ආ) දේපළ සංක්‍රමණය වනු ලබන අවස්ථාවේ දී ඒ බඩු විකිණීමේ අයිතිවාසිකම අයිතිකරුට තිබිය යුතු බවට අයිතිකරු කෙරෙහි බලපාන ගම්‍යමාන කොන්දේසියක් ;

(ඇ) දේපළ සංක්‍රමණය වනු ලබන අවස්ථාවේ දී යම් තෘතීය පාර්ශ්වියකු වෙනුවෙන් හෝ ඔහුගේ පිණිස වූ යම් ඝාණභාරයකින් හෝ බැඳීමකින් හෝ බඩු නිදහස් විය යුතු බවට ගම්‍යමාන ප්‍රතිඥා භාරයක්

තිබිය යුතු ය.

(2) සෑම කුලී සින්නක්කර ගිවිසුමක ම බඩු විකිණීමට සුදුසු තත්ත්වයකින් විය යුතු බවට ගම්‍යමාන කොන්දේසියක් තිබිය යුතු ය.

එහෙත්—

(අ) ගිවිසුම් සාදනු ලද අවස්ථාවේ දී අයිතිකරු දැන නොසිටීම යුක්ති සහගත වන දෝෂ සම්බන්ධයෙන් ;

(ආ) බඩු හෝ එහි සැම්පලයක් කුලියට ගන්නා විසින් පරීක්ෂා කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පරීක්ෂණයෙන් අනාවරණය විය යුතුව තිබූ දෝෂ සම්බන්ධයෙන් ;

(ඇ) දෝෂ වශයෙන් හෝ ඒ සමාන ප්‍රතිඵලයක් ගෙන දෙන වෙනත් යම් විස්තරයකින් ගිවිසුමේ සඳහන් කරනු ලැබුව ද ඒ ගිවිසුමෙහි සඳහන් දෝෂ සම්බන්ධයෙන් ;

(ඈ) බඩු පාවිච්චි කළ බඩු වූ විටක ඒ බවට වූ ප්‍රකාශයක් ගිවිසුමෙහි ඇතුළත් වන්නේ නම් ද

එවැනි කොන්දේසියක් ගම්‍යමාන නොවිය යුතු ය.

(3) බඩු අවශ්‍ය කරනු ලබන්නේ යම් විශේෂ කාර්යයක් සඳහා ද ඒ විශේෂ කාර්යය කුලියට ගන්නා විසින් ප්‍රකාශිත වශයෙන් ලියවිල්ලකින් හෝ ගම්‍යමාන වශයෙන් අයිතිකරුට දන්වනු ලැබ ඇති අවස්ථාවක, ඒ බඩු ඒ කාර්යය සඳහා යුක්තිසහගත ලෙස සුදුසු බවට ගම්‍යමාන කොන්දේසියක් තිබිය යුතු ය.

(4) සැම්පලයකට යොමු කිරීමෙන් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ බඩු කුලියට දෙනු ලබන හෝ විකිණීමට එකඟ වූ අවස්ථාවක—

(අ) බඩු තොගය තත්ත්වයෙන් සැම්පලයට අනුරූප වන බවට ගම්‍යමාන කොන්දේසියක් අයිතිකරු විසින් දෙනු ලැබිය යුතු ය; තව ද

(ආ) බඩු තොගය සැම්පලය සමග තුලනය කිරීමෙහි ලා යුක්ති සහගත අවස්ථාවක් කුලියට ගන්නාට අයිතිකරු විසින් ලබා දිය යුතු බවට ගම්‍යමාන කොන්දේසියක් දෙනු ලැබිය යුතු ය.

(5) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ විස්තරය අනුව බඩු කුලියට දෙනු ලබන අවස්ථාවක, හෝ විකිණීමට එකඟ වූ අවස්ථාවක, බඩු විස්තරයට අනුරූප විය යුතු බවට ගම්‍යමාන කොන්දේසියක් විය යුතු ය. තව ද සැම්පලයකට යොමු කිරීමෙන් මෙන් ම යම් විස්තරයක් අනුව ගිවිසුම යටතේ බඩු කුලියට දෙනු ලබන්නේ නම් හෝ විකිණීමට එකඟ වූයේ නම් විස්තරයට බඩු අනුරූප නොවෙතොත් සැම්පලය සමග ඒ බඩු තොගය අනුරූප වීම ප්‍රමාණවත් නොවිය යුතු ය.

(6) කුලී සින්නක්කර ගිවිසුමක වූ (3) වන උපවගන්තියේ දක්වා ඇති කොන්දේසිය බැහැර කරන්නා වූ හෝ සුළු වශයෙන් වෙනස් කරනු ලබන්නා වූ යම් විධිවිධානයක්, ගිවිසුම් සෑදීමට පෙර, කුලියට ගන්නාගේ දැන ගැනීමට සලස්වන ලද බව සහ එහි ප්‍රතිඵලය ඔහුට පැහැදිලි කර දෙනු ලැබූ බව අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ විධිවිධානය කෙරෙහි විශ්වාසය තැබීමට අයිතිකරුට හිමිකම නොතිබිය යුතු ය.

කුලී සින්නක්කර ගාස්තු පිළිබඳ සීමාව.

5. (1) මේ වගන්තියේ—

(අ) කුලී සින්නක්කර වාරිකයක් සම්බන්ධයෙන් වන විට, "අත්පිට මිල වාරිකය" යන්නෙන් (ආ) ඡේදයෙහි අර්ථකථනය කොට ඇති පරිදි යම් තැන්පතුවක් අඩු කිරීමෙන් පසු කුලී සින්නක්කර වාරිකයේ මුදල් ප්‍රමාණය කුලී සින්නක්කර මිලෙහි සම්පූර්ණ මුදල් ප්‍රමාණයට දරන අනුපාතය ම ශුද්ධ අත්පිට මිලට දරන මුදල් ප්‍රමාණයක් අදහස් වේ;

(ආ) "තැන්පතුව" යන්නෙන් මුදලක් ගෙවීමෙන් හෝ බඩු පැවරීමෙන් හෝ භාර දීමෙන් හෝ වෙනත් යම් ක්‍රමවලින් හෝ ගෙවා නිමකරනු ලැබිය යුතු වුව ද ගෙවා නිමකරනු ලැබ ඇති වුව ද තැන්පතුවක හෝ වෙනත් මූලික ගෙවීමක ආකාරයෙන් හෝ එවැනි යම් තැන්පතුවක් හෝ ගෙවීමක් හේතු කොටගෙන කුලියට ගන්නාට බැර කරන ලද හෝ බැර කරනු ලැබිය යුතු වූ, කුලී සින්නක්කර ගිවිසුම යටතේ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් අදහස් වේ;

(ඇ) කුලී සින්නක්කර ගිවිසුමක අඩංගු වූ බඩු සම්බන්ධයෙන් වන විට, "ශුද්ධ අත්පිට මිල" යන්නෙන් මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි අර්ථකථනය කොට ඇති පරිදි යම් තැන්පතුවක් අඩු කිරීමෙන් පසු 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ කුලී සින්නක්කර ගිවිසුමෙහි නිශ්චය කිරීමට නියමිත ඒ බඩුවල අත්පිට මිල අදහස් වේ;

(ඇ) යම් බඩු සඳහා වූ කුලී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට, "ශුද්ධ කුලී සින්නක්කර ගාස්තු" යන්නෙන් ඒ බඩුවල ශුද්ධ කුලී සින්නක්කර මිල සහ ශුද්ධ අත්පිට මිල අතර වූ වෙනස අදහස් වේ;

(ඉ) කුලී සින්නක්කර ගිවිසුමක අඩංගු වූ බඩු සම්බන්ධයෙන් වන විට, "ශුද්ධ කුලී සින්නක්කර මිල" යන්නෙන්—

(i) කුලියට ගන්නාට හෝ ඔහුගේ අණට බඩු හෝ ඒවා ඉන් කිසිවක හෝ භාර දීමේ වියදම් පියවීම පිණිස ගෙවිය යුතු වන්නා වූ ද කුලී සින්නක්කර මිලෙහි ඇතුළත්ව ඇතැයි ගිවිසුමෙහි සඳහන් කොට ඇත්තා වූ ද යම් මුදල් ප්‍රමාණයක්;

(ii) බඩු හෝ ගිවිසුම හෝ ඒ දෙකම සම්බන්ධයෙන් යම් නීතියක් යටතේ ලියාපදිංචි කිරීමේ ගාස්තු හෝ වෙනත් ගාස්තු පියවීම පිණිස ගෙවනු ලැබිය යුතු වන්නා වූ ද කුලී සින්නක්කර මිලෙහි ඇතුළත්ව ඇතැයි ගිවිසුමෙහි සඳහන් වන්නා වූ ද යම් මුදල් ප්‍රමාණයක්;

(iii) බඩු සම්බන්ධයෙන් රක්ෂණය සඳහා ගෙවිය යුතු වන්නා වූ ද කුලී සින්නක්කර මිලෙහි ඇතුළත්ව ඇතැයි ගිවිසුමෙහි සඳහන් වන්නා වූ ද යම් මුදල් ප්‍රමාණයක්;

(iv) කුලී සින්නක්කර මිලෙහි ඇතුළත්ව ඇතැයි ගිවිසුමෙහි සඳහන් වන්නා වූ ද, සවිකිරීමේ ගාස්තු වශයෙන් ගෙවිය යුතු වූ ද මුදල් ප්‍රමාණයක් වේනොත් ඒ මුදල් ප්‍රමාණය;

(v) (ඇ) ඡේදයෙහි අර්ථකථනය කොට ඇති යම් තැන්පතුවක්; සහ

(vi) කුලී සින්නක්කර ගිවිසුමෙහි සඳහන් වන්නාවූ ද බඩු කුලියට දීම හෝ විකිණීම හෝ මත බද්දක් වන්නාවූ ද ව්‍යාපාර පිරිවැටුම් බද්ද හෝ වෙනත් බද්දක් වශයෙන් ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක්

අඩු කිරීමෙන් පසු 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ කුලී සින්නක්කර ගිවිසුමෙහි නිශ්චය කරනු ලැබීමට නියමිත ඒ බඩුවල කුලී සින්නක්කර මිලෙහි මුළු මුදල් ප්‍රමාණය අදහස වේ;

(ඊ) කුලී සින්නක්කර ගිවිසුම සම්බන්ධයෙන් වන විට "ව්‍යවස්ථාපිත ගාස්තු" යන්නෙන් (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ගණන් බලනු ලැබූ මුදල අදහස් වේ.

(2) ව්‍යවස්ථාපිත ගාස්තු. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට ණයට දෙන අනුප්‍රමාණය සහ ජාතික ආර්ථිකයේ යහපත කෙරෙහි සැලකිල්ල ඇතිව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා

විමසීමෙන් පසු අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වර්ෂයකට සියයට අනුප්‍රමාණයක් අනුව පහත දැක්වෙන සූත්‍රයට අනුකූලව ගණන් බලනු ලැබූ මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

$$\text{ව්‍යගා} = \frac{\text{ශුමි} \times \text{අ} \times \text{කා}}{100}$$

ව්‍යගා = යන්නෙන් ව්‍යවස්ථාපිත ගාස්තු නිරූපණය කෙරේ;

ශුමි = යන්නෙන් ශුද්ධ අත්පිට මිල නිරූපණය කෙරේ;

අ = යන්නෙන් අනුප්‍රමාණය නිරූපණය කෙරේ; තව ද

කා = යන්නෙන් ගිවිසුමෙහි දිනය සහ ගිවිසුම යටතේ අවසාන කුලී සින්නක්කර වාරිකය ගෙවිය යුතු දිනය අතර ගත වන අවුරුදුවලින් හා අවුරුදු භාගවලින් ප්‍රකාශ කෙරෙන කාලය නිරූපණය කෙරේ.

මේ උපවගන්තියේ "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

(3) කුලී සින්නක්කර ගිවිසුමකට අදාළ ශුද්ධ කුලී සින්නක්කර ගාස්තු, ඒ ගිවිසුමට අදාළ වූ ද (2) වන උපවගන්තියේ විධිවිධාන වලට අනුකූලව ගණන් බලනු ලැබූ ද ව්‍යවස්ථාපිත ගාස්තු ඉක්මවන අවස්ථාවක, ශුද්ධ කුලී සින්නක්කර ගාස්තු ඉහත කී ව්‍යවස්ථාපිත ගාස්තු ඉක්මවන්නේ යම් මුදල් ප්‍රමාණයකින් ද ඒ මුදල් ප්‍රමාණය තම බැරකමෙන් අඩු කර ගැනීමට කුලියට ගන්නාට හිමිකම ඇත්තේ ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් මුදල් ප්‍රමාණය තම බැරකමෙන් අඩු කර ගැනීමට කුලියට ගන්නාට හිමිකම ඇති අවස්ථාවක තම බැරකම්වලින් එම මුදල් ප්‍රමාණය අඩු කළ යුතු ය. තවද ගිවිසුම යටතේ අන්‍ය කාරයකින් අය විය යුතු මුදල් ප්‍රමාණයෙන් එම මුදල් ප්‍රමාණය කුලියට ගන්නා විසින් හිලව් කරනු ලැබිය හැකි අතර එය එසේ හිලව් නොකරනු ලබන ප්‍රමාණයට අයිතිකරුගෙන් තමාට ලැබිය යුතු ණයක් වශයෙන් කුලියට ගන්නා විසින් අය කර ගනු ලැබිය හැකි ය.

දේපළ සංක්‍රමණය වීම.

6. මේ පනතේ විධිවිධානවලට යටත්ව, කුලී සින්නක්කර ගිවිසුමකට අදාළ වන්නා වූ බඩුවල දේපළ, ගිවිසුමෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් මිල දී ගැනීම සම්පූර්ණ කරන ලද විට පමණක් කුලියට ගන්නාට සංක්‍රමණය විය යුතු ය.

## කුලියට ගන්නාගේ අයිතිවාසිකම් හා බැඳීම්

ප්‍රතිදානය සමග යම් අවස්ථාවක මිල දී ගැනීමට කුලියට ගන්නාගේ අයිතිවාසිකම.

7. (1) කුලියට ගන්නා විසින්, කුලී සින්නක්කර ගිවිසුම පවත්නා කාලය තුළ යම් අවස්ථාවක දී ඈහ තත්කාර්ය කිරීම පිණිස තම අභිප්‍රාය පිළිබඳ දින දහහතරකට නොඅඩු ලියවිල්ලකින් වූ දන්වීමක් අයිතිකරුට දීමෙන් පසු, (2) වන උපවගන්තියේ විධිවිධාන සලස්වන ලද ආකාරයෙන් ගණන් බලන ලද ප්‍රතිදානය අඩු කරනු ලැබූ එහි කුලී සින්නක්කර මිල හෝ ශේෂය අයිතිකරුට ගෙවීමෙන් හෝ අයිතිකරු වෙත ඉදිරිපත් කිරීමෙන් ඒ බඩු මිල දී ගැනීම සම්පූර්ණ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා වූ ප්‍රතිදානය, කුලී සින්නක්කර මිලෙහි එතෙක් අය විය යුතුව නැති ශේෂය කුලී සින්නක්කර මිලට දරන අනුපාතයම යම් මුදල් ප්‍රමාණයක් කුලී සින්නක්කර ගාස්තුවලට දරන්නේද, ඒ මුදල් ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට සමාන මුදල් ප්‍රමාණයක් විය යුතු ය.

මේ උපවගන්තියේ "කුලී සින්නක්කර ගාස්තු" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුමෙහි ප්‍රකාශ කොට ඇති පරිදි කුලී සින්නක්කර මිල සහ අත්පිට මිල අතර වූ වෙනස අදහස් වේ.

(3) කුලී සින්නක්කර ගිවිසුමෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ විධිවිධාන බල සහිත විය යුතු ය. එහෙත් ගිවිසුමේ නියමයන් අනුව මේ වගන්තියෙන් ඉඩ දෙන ලද ප්‍රතිදානයට වඩා ඉහළ ප්‍රතිදානයක් ලැබීමට කුලියට ගන්නාට හිමිකම ඇති අවස්ථාවක, ගිවිසුමෙන් විධිවිධාන සලස්වන ලද ප්‍රතිදානය ලැබීමට ඔහුට හිමිකම ඇත්තේ ය.

*කිසියම් අවස්ථාවක ගිවිසුම අවසන් කිරීමට කුලියට ගන්නාගේ අයිතිවාසිකම.*

8. (1) කුලී සින්නක්කර ගිවිසුම යටතේ අවසාන ගෙවීම අය විය යුතු වීමට පෙර යම් අවස්ථාවක, තත් කාර්යය කිරීමට කුලියට ගන්නා විසින්, තම අභිප්‍රාය පිළිබඳව දින දහහතරකට නොඅඩු ලියවිල්ලකින් වූ දැන්වීමක් අයිතිකරුට දීමෙන් පසු සහ අයිතිකරුට බඩු ආපසු භාර දීමෙන් පසු නැතහොත් අයිතිකරු වෙත ඉදිරිපත් කිරීමෙන් පසු, (2) වන උපවගන්තිය යටතේ තමා ගෙවීමට යටත් යම් මුදලක් වේනොත් එය ද ඇතුළුව කුලී සින්නක්කර මිල සම්බන්ධයෙන් උපචිත වූ, එහෙත් තමා විසින් ගෙවනු නොලැබූ යම් මුදල් ප්‍රමාණයක් අයිතිකරුට ගෙවීමෙන් හෝ අයිතිකරු වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ කුලියට ගන්නා විසින් කුලී සින්නක්කර ගිවිසුම අවසන් කරනු ලැබිය හැකි ය.

(2) කුලියට ගන්නා විසින් (1) වන උපවගන්තිය යටතේ ගිවිසුම අවසන් කරනු ලබන්නා වූ ද ඒ අවසන් කිරීම වෙනුවෙන් නියම කරන ලද මුදලක් ගෙවීම සඳහා ගිවිසුමෙන් විධිවිධාන සලස්වනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ මුදල ගෙවීමට කුලියට ගන්නාගේ බැඳීම පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය—

(අ) ගෙවන ලද මුදල් ප්‍රමාණවල සහ අවසන් කිරීමට පෙරාතුව ම කුලී සින්නක්කර මිල සම්බන්ධයෙන් අයවිය යුතු වූ මුදල් ප්‍රමාණවල මුළු එකතුව කුලී සින්නක්කර මිලෙන් දෙකෙන් පංගුවක් ඉක්මවන අවස්ථාවක, එසේ නියම කරන ලද මුදල ගෙවීමට කුලියට ගන්නා යටත් නොවිය යුතු ය ;

(ආ) ගෙවන ලද මුදල් ප්‍රමාණවල සහ අවසන් කිරීමට පෙරාතුව ම කුලී සින්නක්කර මිල සම්බන්ධයෙන් අයවිය යුතු වූ මුදල් ප්‍රමාණවල මුළු එකතුව කුලී සින්නක්කර මිලෙන් භාගයක්

නො ඉක්මවන අවස්ථාවක, එකී මුළු මුදල සහ එකී දෙකෙන් පංගුව අතර වූ වෙනස හා ගිවිසුමෙහි නියම කරන ලද මුදල යන දෙකින් කවර වූ හෝ අඩු මුදල ගෙවීමට කුලියට ගන්නා යටත් විය යුතු ය.

(3) අවසන් කිරීමට පෙර අයවිය යුතු ලෙස උපචිත විය හැකි වූ යම් කුලියක් සඳහා වූ යම් බැඳීමකින් (2) වන උපවගන්තියේ කිසිවකින් කුලියට ගන්නා නිදහස් නොවන්නේ ය.

(4) කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමට මේ වගන්තියෙන් කුලියට ගන්නා වෙත පවරන ලද අයිතිවාසිකම බැහැර කරනු ලබන්නා වූ හෝ සීමා කරනු ලබන්නා වූ නැතහොත් මේ වගන්තිය යටතේ ඔහු විසින් කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමේ හේතුවෙන් මේ පනතින් නියම කරන ලද බැඳීමට අතිරේකව යම් බැඳීමක් නියම කරනු ලබන්නා වූ යම් ගිවිසුමක යම් විධිවිධානයක් බල රහිත විය යුතු ය.

(5) මේ පනතේ වෙනත් යම් විධිවිධානයක් යටතේ හා ඒ ප්‍රකාර කුලී සින්නක්කර ගිවිසුමක් අවසන් කිරීමට කුලියට ගන්නකුට ඇති යම් අයිතිවාසිකමක් කෙරෙහි මේ වගන්තියේ කිසිවක් හානි කර නොවිය යුතු ය.

**ගිවිසුම් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් වූ ගෙවීම් නතුකිරීමට කුලියට ගන්නාගේ අයිතිවාසිකම.**

9. කුලී සින්නක්කර ගිවිසුම් දෙකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් එකම අයිතිකරුවකුට ගෙවීම් කිරීමට යටත් කුලියට ගන්නකුට ඒවා පටිහැනිව යම් ගිවිසුමක් ඇත ද සියලු ගිවිසුම් යටතේ එවිකට අය විය යුතු මුළු මුදල් ප්‍රමාණය ගෙවා අවසන් කිරීමට ප්‍රමාණවත් නොවන්නා වූ යම් ගෙවීමක් ගිවිසුම් සම්බන්ධයෙන් කිරීම මත, ගිවිසුම්වලින් යම් එක් ගිවිසුමක් යටතේ අයවිය යුතු මුදල පියවීම සම්බන්ධයෙන් හෝ ඒ උදෙසා නැතහොත් ගිවිසුම්වලින් යම් එක් ගිවිසුමක් මත අයවිය යුතු මුදල් ප්‍රමාණ පියවීම සම්බන්ධයෙන් හෝ ඒ උදෙසා එසින් නැතහොත් සුදුසු යයි තමා කල්පනා කරන්නා වූ අනුපාතයක් අනුව යම් ගිවිසුම් දෙකක් හෝ වැඩි ගණනක් යටතේ අයවිය යුතු මුදල පියවීම සම්බන්ධයෙන් හෝ ඒ උදෙසා තමා විසින් එසේ ගෙවන ලද මුදල නතුකිරීමට හිමිකමක් තිබිය යුතු ය. තව ද ඉහත කී පරිදි එවැනි යම් නතුකිරීමක් කිරීම ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, එසේ ගෙවන ලද මුදල, මේ වගන්තිය ප්‍රකාර, කුලී සින්නක්කර ගිවිසුම් වලට ඇතුළත් වූ පිළිවෙළ අනුව අනුපිළිවෙළින් වූ ඒ ගිවිසුම් යටතේ අයවිය යුතු මුදල් පියවීම උදෙසා නතුකරනු ලැබූ ලෙස පවතින්නේ ය.

**කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලියට ගන්නාගේ අයිතිවාසිකම හෝ සම්බන්ධතාව පවරා දීම හා ලේඛනය කිරීම.**

10. (1) කුලියට ගන්නා විසින් අයිතිකරුගේ සහ එවැනි ගිවිසුමක වෙනත් සියලු පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව ද, නැතහොත් ලිඛිත කැමැත්ත අයුක්තිසහගත ලෙස අත්හිටවනු ලබන්නේ නම් ඔහුගේ කැමැත්ත නොමැතිව ද, කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ වූ තම අයිතිවාසිකම, හිමිකම, සම්බන්ධතාව සහ බැඳීම් පවරා දෙනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ අන්‍යාකාරයකින් විධිවිධාන සලසනු ලැබ ඇති පරිදි හැර, (1) වන උපවගන්තිය යටතේ වූ පවරා දීමකට අයිතිකරුවකු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්ව

කරුවකු විසින් තම කැමැත්ත දීම සඳහා කිසිම ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිඡ්ඨාවක් හෝ නියම කරනු නොලැබිය යුතු ය. තව ද තම කැමැත්ත සඳහා එවැනි යම් ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිඡ්ඨාවක් හෝ අයිතිකාරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු විසින් නියම කරනු ලැබුවහොත්, ඒ කැමැත්ත අයුක්තිසහගත ලෙස අත්හිටවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ පැවරීමක් සම්බන්ධයෙන් කුලියට ගන්නකු විසින් කරනු ලබන ඉල්ලීමකට තම කැමැත්ත දීම අයිතිකරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු විසින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ අවස්ථාවක, පැවරීම පිළිබඳව අයිතිකරුගේ හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරුවකුගේ කැමැත්ත අයුක්තිසහගත ලෙස අත්හිටවනු ලැබ ඇති බවට ප්‍රකාශ කරන ආඥාවක් සඳහා කුලියට ගන්නා විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි අතර, එවැනි ආඥාවක් කරනු ලබන අවස්ථාවක, කැමැත්ත අයුක්ති සහගත ලෙස අත්හිටවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පැවරීමකට ඒ කැමැත්ත දීමේ කොන්දේසියක් වශයෙන්, කුලී සින්නක්කර ගිවිසුම යටතේ වූ සියලු පැහැර හැරීම් ගෙවනු ලැබිය යුතු බවට අයිතිකරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු හෝ විසින් නියම කරනු ලැබිය හැකි ය. තව ද ඒ සම්බන්ධයෙන් කුලියට ගන්නාගේ නොකඩවා පවත්නා පෞද්ගලික බැඳීම කෙරෙහි බලපෑමක් නොමැතිව, නොගෙවා ඉතිරිව ඇති කුලී වාරික ගෙවීමට සහ කුලී සින්නක්කර ගිවිසුමේ ශේෂ කාලය තුළ එහි වෙනත් සියලු නියම යන් සහ කොන්දේසි ඉටු කිරීමට සහ පිළිපැදීමට පෞද්ගලිකව යටත් වන බවට පැවරුම්ලාභියා අයිතිකරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු හෝ සමග එකඟ වන්නා වූ ද ඒ බැඳීම් සම්බන්ධයෙන් පැවරුම්ලාභියා විසින් කුලියට ගන්නාට හානි පූරණය කරනු ලබන්නා වූ ද අයිතිකරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු හෝ විසින් අනුමත කරන ලද ආකෘතියක් අනුව වූ ද පවරා දීමේ ගිවිසුමක් ලියා අත්සන් කොට අයිතිකරුට භාර දීමට අයිතිකරු හෝ එවැනි ගිවිසුමක වෙනත් යම් පාර්ශ්වකරු විසින් කුලියට ගන්නාට සහ පැවරුම් ලාභියාට නියම කරනු ලැබිය හැකි ය.

(5) කුලී සින්නක්කර ගිවිසුමෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

කුලී සින්නක්කර ගිවිසුම යටතේ අයිතිකරුගේ අයිතිවාසිකම හෝ සම්බන්ධතාව පවරාදීම හෝ ප්‍රේෂනය කිරීම.

**11.** අයිතිකරු විසින් කුලියට ගන්නාගේ සහ එවැනි ගිවිසුමක වෙනත් සියලු පාර්ශ්වකරුවන්ගේ ලිඛිත කැමැත්ත ඇතිව ද, නැත හොත් ලිඛිත කැමැත්ත අයුක්තිසහගත ලෙස අත්හිටවනු ලබන් නේ නම් ඒ ලිඛිත කැමැත්ත නොමැතිව ද, කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ වූ තම අයිතිවාසිකම, හිමිකම, සම්බන්ධතාව සහ බැඳීම් පවරා දෙනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ කරනු ලබන පවරා දීමකට 10 වන වගන්තියේ (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

ගිවිසුම අනුව කටයුතු කිරීමට කුලියට ගන්නාගේ බැඳීම.

12. මේ පනතේ විධිවිධානවලට යටත්ව—

(අ) ගිවිසුමට අනුකූලව කුලිය ගෙවීමට ; සහ

(ආ) අන්‍යාකාරවලින් ගිවිසුමේ නියමයන් අනුව කටයුතු කිරීමට කුලියට ගන්නකු බැඳී සිටින්නේ ය.

බඩු පිළිබඳව දක්වන ලද සැලකිල්ල සම්බන්ධයෙන් කුලියට ගන්නාගේ බැඳීම.

13. (1) පටගැනිව ගිවිසුමක් නොමැතිවිට කුලියට ගන්නා—

(අ) සමාන වූ තොග, ප්‍රමාණය සහ වටිනාකම ඇති තම බඩු සම්බන්ධයෙන්, සමාන අවස්ථානුගත කරුණු යටතේ, සාමාන්‍ය උද්‍යෝගය ඇති මිනිසකු වශයෙන් යම් සැලකිල්ලක් දක්වනු ලබන්නේ ද, ඒ සැලකිල්ලම කුලී සින්නක්කර ගිවිසුමට අදාළ බඩු සම්බන්ධයෙන් ද දැක්වීමට බැඳී සිටින්නේ ය ;

(ආ) (අ) ඡේදයෙහි විස්තර කරන ලද සැලකිලි ප්‍රමාණය බඩු සම්බන්ධයෙන් දක්වා ඇතොත්, බඩු සම්බන්ධයෙන් සිදු වූ පාඩුවක්, විනාශවීමක් හෝ පිරිහීයාමක් සඳහා වගකිවයුතු නොවන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව බඩු සම්බන්ධයෙන් සැලකිල්ලක් දැක්වීම පැහැර හරිනු ලැබීමෙන් සිදු වූ යම් අලාභයක් සඳහා අයිතිකරුට වන්දි ගෙවීමට කුලියට ගන්නා යටත් වන්නේ ය.

(3) බඩු සම්බන්ධයෙන් පාඩුවක්, විනාශවීමක් හෝ පරිහානියක් සිදු වී ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් කර ඇති අන්දමේ සැලකිල්ලක් තමා විසින් දක්වන ලද බව ඔප්පු කිරීමේ භාරය කුලියට ගන්නා මත පැවරෙන්නේ ය.

බඩු පාවිච්චි කිරීම සම්බන්ධයෙන් කුලියට ගන්නාගේ බැඳීම.

14. කුලී සින්නක්කර ගිවිසුම අදාළ වන්නේ යම් බඩු සම්බන්ධයෙන් ද ඒ බඩු වලින් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූල නොවන ආකාරයකින් කුලියට ගන්නා විසින් යම් ප්‍රයෝජනයක් ගනු ලබන්නේ නම්, ඒ ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ ප්‍රයෝජනයට ගනු ලබන කාලය තුළ බඩුවලට සිදුවන යම් අලාභයක් සඳහා අයිතිකරුට වන්දි ගෙවීමට කුලියට ගන්නා යටත් වන්නේ ය.

බඩු ඇති ස්ථානය පිළිබඳ තොරතුරු දීමට කුලියට ගන්නාගේ බැඳීම.

15. (1) කුලී සින්නක්කර ගිවිසුමක් ප්‍රකාර, ගිවිසුමට අදාළ බඩු තමාගේ සන්තකයෙහි හෝ පාලනයෙහි තබා ගැනීම කුලියට ගන්නාගේ කාර්යයක් වන අවස්ථාවක, අයිතිකරුගේ ලියවිල්ලකින් වූ ඉල්ලීමක් ලැබුණු විට කුලියට ගන්නා විසින් තොරතුරු දෙනු ලබන අවස්ථාවේ දී බඩු ඇති ස්ථානය අයිතිකරුට දැන්විය යුතු ය. නැතහොත් තැපැල් මගින් යවනු ලැබුවේ නම් එය තැපැල් කරන අවස්ථාවේ දී බඩු ඇති ස්ථානය අයිතිකරුට දැන්විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් දින දහහතරක් ඇතුළත එකී තොරතුරු දීම, යුක්ති සහගත හේතුවක් නොමැතිව, කුලියට ගන්නා විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඔහු

වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්ම වන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

අයිතිකරු විසින් බඩු නැවත සන්තකයට ගනු ලබන අවස්ථාවක කුලියට ගන්නාගේ අයිතිවාසිකම.

16. (1) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙන ලද හෝ විකිණීම සඳහා එකඟ වූ බඩු අයිතිකරු විසින් 19 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ නැවත සන්තකයට ගනු ලබන අවස්ථාවක, පහත දැක්වෙන මුදල් ප්‍රමාණවල එකතුවට වඩා කුලී සින්නක්කර මිල අඩු වෙතොත්, එසේ අඩුවන මුදල් ප්‍රමාණය කුලියට ගන්නා විසින් අයිතිකරුගෙන් අයකර ගනු ලැබිය හැකි ය. එනම්—

(අ) නැවත සන්තකයට ගැනීමේ දිනය දක්වා කුලී සින්නක්කර මිල වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණ ; සහ

(ආ) නැවත සන්තකයට ගැනීමේ දිනයෙහි බඩුවල වටිනාකම.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, නැවත සන්තකයට ගැනීමේ දිනයෙහි යම් බඩුවල වටිනාකම යන්නෙන් පහත දැක්වෙන මුදල් ප්‍රමාණයන්ගේ එකතුව, එනම්—

(i) බඩු නැවත සන්තකයට ගැනීම සඳහා අයිතිකරු විසින් දරන ලද යුක්ති සහගත වියදම් ;

(ii) බඩු ගබඩා කිරීම, අලුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම පිළිබඳව අයිතිකරු විසින් යුක්ති සහගත ලෙස දරන ලද යම් මුදල් ප්‍රමාණයක් ;

(iii) (අයිතිකරු විසින් තදනන්තරව බඩු විකුණනු ලැබුව ද, විකුණනු නොලැබුව ද නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කරනු ලැබුව ද) බඩු විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සම්බන්ධයෙන් වූ යුක්ති සහගත වියදම් ; සහ

(iv) තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ බඩුවලට අදාළව ගෙවිය යුතු වූ ද ගෙවීමට කුලියට ගන්නා යටත් වූ ද ගිඟ බදු සහ වෙනත් ගාස්තු ගෙවීම සඳහා අයිතිකරු විසින් වියදම් කරන ලද මුදල් ප්‍රමාණය

යන මුදල් ප්‍රමාණයන්ගේ එකතුව අඩුකොට ඒ දිනයෙහි අයිතිකරු විසින් බඩු සඳහා යුක්ති සහගත ලෙස ලබාගත හැකි උපරිම මිල අදහස් වන්නේ ය.

(3) කුලී සින්නක්කර මිල (1) වන උපවගන්තියෙහි සඳහන් මුදල් ප්‍රමාණවල එකතුව ඉක්මවන අවස්ථාවක, අයිතිකරු විසින් කුලියට ගන්නාගෙන් ඒ අතිරික්තය අයකර ගනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තියේ විධිවිධාන යටතේ අයිතිකරුගෙන් අයවිය යුතු මුදල් ප්‍රමාණය හෝ ඒ මුදල් ප්‍රමාණයෙන් යම් පංගුවක්, එකී මුදල් ප්‍රමාණය ගෙවීම සඳහා කුලියට ගන්නා විසින් අයිතිකරුට දැන්වීමක් භාර දීමේ දින සිට දින තිහක කාල සීමාවක් ඇතුළත කුලියට

ගන්නාට ගෙවීම් ඔහු විසින් පැහැර හරිනු ලැබුවහොත්, එකී දින තිහක කාලසීමාව ඉකුත් වීමේ දින සිට වර්ෂයකට සියයට දොළහක අනුප්‍රමාණය අනුව ඒ මුදල් ප්‍රමාණය මත පොලී ගෙවීමට අයිතිකරු යටත් විය යුතු ය.

(5) අයිතිකරු විසින් නැවත සන්තකයට ගන්නා ලද බඩු ඔහු විසින් විකුණනු ලැබ ඇති අවස්ථාවක, නැවත සන්තකයට ගැනීමේ දිනයෙහි බඩු සඳහා ඔහු විසින් ලබා ගන්නා ලද මිල ඔහු විසින් යුක්ති සහගත ලෙස ලබාගත හැකිව තිබූ උපරිම මිල බව ඔප්පු කිරීමේ භාරය ඔහු සතු වන්නේ ය.

(6) මේ වගන්තියේ කාර්ය සඳහා නැවත සන්තකයට ගැනීමේ දිනයෙහි බඩු සඳහා අයිතිකරු විසින් ලබා ගනු ලැබිය හැකි උපරිම මිල—

(අ) (i) තත් කාලයේ බලපවත්නා යම් නීතියකින් අයිතිකරුගේ නමින් බඩු ලියාපදිංචි කළ යුතු බවට නියම කරනු ලැබ ඇති සෑම අවස්ථාවක ම, අයිතිකරුගේ නමින් ඒ බඩු ලියාපදිංචි කළ දින සිට දින තිහක් ඇතුළත; හෝ

(ii) වෙනත් යම් අවස්ථාවක නැවත සන්තකයට ගැනීමේ දින සිට දින තිහක් ඇතුළත

සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළ කරනු ලබන ප්‍රවෘත්ති පත්‍රවල ඒ බඩු විකිණීම සඳහා දැන්වීමක් පළ කරනු ලැබූ විට, ඒ දැන්වීමට පිළිතුරු වශයෙන්, ඒ බඩු සඳහා අයිතිකරු වෙත පිරිනමනු ලබන උපරිම මිල ; හෝ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් මිලට කුලියට ගන්නා එකඟ නොවන යම් අවස්ථාවක—

(i) මේ උපවගන්තියේ කාර්ය සඳහා බඩුවල වටිනාකම තීරණය කළ යුතු තැනැත්තා වශයෙන් කුලී සින්නක්කර ගිවිසුමෙහි සඳහන් කරනු ලැබ ඇති තැනැත්තා විසින් ; හෝ

(ii) එසේ සඳහන් කරනු ලැබූ තැනැත්තකු නොමැති නම් කුලී සින්නක්කර ගිවිසුමේ සියලුම පාර්ශ්වකරුවන් එකඟත්වයෙන් නම් කරනු ලැබූ තැනැත්තකු විසින් ; හෝ

(iii) එවැනි නම් කිරීමකට එම පාර්ශ්වකරුවන් එකඟ නොවන්නේ නම් කුලී සින්නක්කර ගිවිසුමෙහි යම් පාර්ශ්වකරුවකු විසින් කරන ඉල්ලීමක් මත අධිකරණය විසින් නම් කරන ලද තැනැත්තකු විසින්

තීරණය කරනු ලබන බඩුවල වටිනාකම

විය යුතු ය:

එසේ වුව ද, (අ) ඡේදයෙහි සඳහන් මිල, කුලියට ගන්නා විසින් ප්‍රතික්ෂේප කොට දින පහළොවක් ඇතුළත නම් කිරීමක් සඳහා ඉල්ලීම කරනු ලැබුවහොත් මිස, අධිකරණය විසින් (iii) වන අනු ඡේදය යටතේ නම් කිරීමක් කරනු නොලැබිය යුතු ය.

17. කුලී සින්නක්කර ගිවිසුමක සංයුක්ත යම් බඩු බැහැර කිරීමෙන් හෝ විකිණීමෙන් නැතහොත් බඩු ඉවත් කිරීමෙන් හෝ වෙනත් යම් ක්‍රමවලින් අයිතිකරුට වංචා කරන හෝ වංචා කිරීමට තැත් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු අතර, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

කුලියට ගන්නා විසින් බඩු වංචනික ලෙස විකිණීම හෝ බැහැර කිරීම.

අයිතිකරුගේ අයිතිවාසිකම් හා බැඳීම්

18. (1) කුලී සින්නක්කර ගිවිසුමෙහි විධිවිධාන සලස්වන ලද පරිදි කුලිය ගෙවීම සම්බන්ධයෙන් එක් පැහැර හැරීමකට වැඩි පැහැර හැරීම් ගණනක් කුලියට ගන්නකු විසින් කරනු ලබන අවස්ථාවක, එවිට 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සහ—

(අ) සතියක හෝ ඊට අඩු කාල පරතරයක දී කුලිය ගෙවිය යුතු අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එක් සතියකට ; සහ

(ආ) වෙනත් යම් අවස්ථාවක් සම්බන්ධයෙන් වන විට දෙසතියකට

නොඅඩු ලියවිල්ලකින් වූ දැන්වීමක් කුලියට ගන්නාට දීමෙන් පසු අවසන් කිරීම පිළිබඳ ලියවිල්ලකින් වූ දැන්වීම කුලියට ගන්නාට දීමෙන් ගිවිසුම් අවසන් කිරීමට අයිතිකරුට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද ගිවිසුමේ නියමයන් යටතේ හිඟ කුලිය මත ගෙවිය යුතු පොලිය සමග හිඟ කුලිය, අවස්ථාවෝචිත පරිදි, එකී එක් සතියක හෝ දෙසතියක කාලසීමාව ඉකුත් වීමට පෙර, කුලියට ගන්නා විසින් අයිතිකරුට ගෙවනු ලැබුවහොත් හෝ ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත්, ගිවිසුම අවසන් කිරීමට අයිතිකරුට හිමිකම නොමැත්තේ ය.

කුලිය ගෙවීම පැහැර හැරීම සඳහා හෝ බලය නොලත් ක්‍රියාවක් සඳහා හෝ ප්‍රකාශිත කොන්දේසි කඩ කිරීම සඳහා හෝ කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමට අයිතිකරුගේ අයිතිවාසිකම්.

(2) කුලියට ගන්නකු විසින්—

(අ) කුලී සින්නක්කර ගිවිසුම අදාළ වන බඩු සම්බන්ධයෙන් ගිවිසුමේ නියමවලින් යම් නියමයකට අනනුකූල වන්නා වූ යම් ක්‍රියාවක් කරන්නේ නම් ; හෝ

(ආ) ගිවිසුමේ යම් ප්‍රකාශිත කොන්දේසියක් කඩ කිරීම මත අයිතිකරු විසින් ගිවිසුම අවසන් කරනු ලැබීමට විධිවිධාන සලස්වා ඇත්තා වූ ගිවිසුමේ යම් ප්‍රකාශිත කොන්දේසියක් කඩ කරන්නේ නම්

ගිවිසුම අවසන් කිරීමට අයිතිකරුට හිමිකම දෙන්නා වූ නිශ්චිත කඩ කිරීම හෝ ක්‍රියාව සඳහන් කරමින් දින තිහකට නොඅඩු ලියවිල්ලකින් වූ දැන්වීමක් කුලියට ගන්නාට දීමෙන් ගිවිසුම අවසන් කිරීමට ඔහුට හිමිකම ඇත්තේ ය:

එසේ වුව ද දැන්වීමෙහි සඳහන් කඩ කිරීම හෝ ක්‍රියාව සම්බන්ධයෙන් කුලියට ගන්නා විසින් ප්‍රතිකර්ම යොදනු ලැබිය හැකි යම් අවස්ථාවක දී, එකී දින තිහක කාලසීමාව ඉකුත් වීමට පෙර පැමිණිලි කරන ලද කඩ කිරීම හෝ ක්‍රියාව සම්බන්ධයෙන් ප්‍රතිකර්ම යෙදීමට

ඒ දැන්වීමෙන් කුලියට ගන්නාට නියම කිරීම අයිතිකරුගේ කාර්යය වන්නේය. තවද පැමිණිලි කරන ලද කඩ කිරීම හෝ ක්‍රියාව සම්බන්ධයෙන් එකී දින තිහක කාල සීමාව ඉකුත් වීමට පෙර කුලියට ගන්නා විසින් ප්‍රතිකර්ම යොදනු ලැබුවහොත් අයිතිකරුට ගිවිසුම අවසන් කිරීමේ අයිතියක් නොතිබිය යුතු ය.

අවසන් කරනු ලැබූ විට අයිතිකරුගේ අයිතිවාසිකම්.

**19.** මේ පනත යටතේ කුලී සින්නක්කර ගිවිසුමක් අවසන් කරනු ලැබ ඇති අවස්ථාවක—

(අ) එවකට ගෙවා ඇති කුලිය සහ මූලික තැන්පතුව රඳවා ගැනීමට සහ අයවිය යුතු හිඟ කුලී අයකර ගැනීමට අයිතිකරුට හිමිකම ඇත්තේ ය:

එසේ වුවද අයිතිකරු විසින් ඒ බඩු නැවත සන්තකයට ගනු ලැබූ විට, කුලිය සහ මූලික තැන්පතුව රඳවා ගැනීම සහ අය විය යුතු හිඟ කුලී අයකර ගැනීම 16 වන වගන්තියේ විධිවිධානවලට යටත් විය යුතු ය;

(ආ) 16 වන වගන්තියේ සහ 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සහ පටහැනිව වූ යම් ගිවිසුමකට යටත්ව බඩු නැවත සන්තකයට ගැනීමට අයිතිකරුට හිමිකම ඇත්තේ ය;

(ඇ) 20 වන වගන්තියේ සහ 21 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව බඩුවල සන්තකය අධිකරණයෙහි නඩුවක් මගින් ලබා ගැනීමට අයිතිකරුට හිමිකම ඇත්තේ ය;

(ඈ) 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සහ 14 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, ගිවිසුම අවසාන වීම ක්‍රියාත්මක වන දින සිට බඩු අයිතිකරුට භාර දෙන ලද හෝ අයිතිකරු විසින් නැවත සන්තකයට ගනු ලැබූ දින දක්වා බඩු භාර නොදීම සඳහා අලාභ ලබා ගැනීමට අයිතිකරුට හිමිකම ඇත්තේ ය.

අධිකරණය මගින් නොවන අන්‍යාකාරයකින් බඩුවල සන්තකය ආපසු ලබා ගැනීමට අයිතිකරුගේ අයිතිවාසිකම පිළිබඳ සීමාව.

**20.** (1) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙනු ලැබ හෝ විකිණීමට එකඟවනු ලැබ ඇත්තා වූ ද (නඩු තීන්දුවක් ප්‍රකාර හෝ අන්‍යාකාරයක් අනුව වුවද) කුලියට ගන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් හෝ යම් ඇපකරුවකු විසින් හෝ, ගිවිසුම නීත්‍යානුකූලව අවසන් වීමට පෙර, කුලී සින්නක්කර මිලෙන් සියයට හැත්තෑපහක් ගෙවා හෝ ඉදිරිපත් කොට ඇත්තා වූ ද අවස්ථාවක, අයිතිකරු විසින් නඩුවක් මගින් නොවන අන්‍යාකාරයකින් කුලියට ගන්නාගෙන් බඩුවල සන්තකය ආපසු ලබාගැනීමට ඇති කිසියම් අයිතිවාසිකමක් බලාත්මක නොකළ යුතු ය:

එසේ වුව ද කුලී සින්නක්කර ගිවිසුමෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇතද, මේ පනතේ විධිවිධානවලට අනුකූලව අයිතිකරු විසින් ගිවිසුම යථා පරිදි අවසන් කොට ඇත්නම් මිස, කුලියට ගන්නාගෙන් බඩුවල සන්තකය ආපසු ලබා ගැනීමට අයිතිකරුට හිමිකම නොතිබිය යුතු ය.

(2) ඉහත සඳහන් උපවගන්තිය කඩකරමින් අයිතිකරු විසින් බඩු ආපසු ලබාගෙන ඇතොත් කුලී සින්නක්කර ගිවිසුම කලින් අවසන්කොට නොමැති නම් එය අවසන් විය යුතු ය. තව ද—

(අ) ගිවිසුම යටතේ සියලු බැඳීම්වලින් කුලියට ගන්නා මුදා හරිනු ලැබිය යුතු අතර, ගිවිසුම යටතේ හෝ ගිවිසුම සම්බන්ධයෙන් ඔහු විසින් දෙන ලද යම් අපයක් යටතේ ඔහු විසින් ගෙවන ලද සියලු මුදල් නඩුවක දී අයිතිකරුගෙන් අයකර ගැනීමට හිමිකම ඇත්තේ ය ; තව ද

(ආ) යම් ඇපකරුවකු විසින් ඇප ගිවිසුම යටතේ හෝ ඒ ගිවිසුම සම්බන්ධයෙන් ඔහු විසින් දෙන ලද යම් ඇපයක් යටතේ ගෙවන ලද සියලු මුදල් නඩුවක දී අයිතිකරුගෙන් අයකර ගැනීමට ඒ ඇපකරුට හිමිකම ඇත්තේ ය.

(3) තමා වෙත පැවරී ඇති යම් අයිතිවාසිකමක් ප්‍රකාර කුලියට ගන්නා විසින් ගිවිසුම අවසන්කොට ඇති යම් අවස්ථාවක මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

බඩු ආපසු ලබාගැනීම සඳහා වූ නඩු වල දී අධිකරණයේ බලතල.

21. (1) 20 වන වගන්තිය අදාළ වන, ඉහතකී පරිදි කුලී සින්නක්කර මිලෙන් සියයට හැත්තෑපහක් ගෙවීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් පසු බඩුවල සන්තකය කුලියට ගන්නාගෙන් ආපසු ලබා ගැනීමේ අයිතිවාසිකම බලාත්මක කිරීමට අයිතිකරුවකු විසින් නඩුවක් පවරනු ලබන අවස්ථාවක, නඩුවේ මුදල සඳහා හිමිකම්පෑමකින් හැර, කුලී සින්නක්කර ගිවිසුම යටතේ හෝ ගිවිසුමට අදාළ යම් ඇප ගිවිසුමක් යටතේ හෝ අයවිය යුතු යම් මුදලක් ගෙවීම බලාත්මක කිරීමට අයිතිකරු විසින් කිසිම පියවරක් ගනු නොලැබිය යුතු ය.

(2) ගිවිසුමේ සියලු පාර්ශ්වකරුවන් සහ යම් ඇපකරුවකු නඩුවේ පාර්ශ්වකරුවන් කළ යුතු ය.

(3) නඩුව විභාග කරන තෙක් අධිකරණය විසින් වෙනත් යම් බලතලවලට අතිරේකව අයිතිකරුගේ ඉල්ලීම මත බඩු පාවිච්චි කිරීම සීමා කිරීමේ හෝ තහනම් කිරීමේ ආඥා හෝ ඒවායේ ආරක්ෂාව සම්බන්ධයෙන් විධාන දෙන්නා වූ ආඥා ඇතුළුව, අලාභවීමෙන් හෝ ක්ෂයවීමෙන් බඩු ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා සාධාරණ යයි අධිකරණය කල්පනා කරන ආඥා කිරීමට අධිකරණයට බලය ඇත්තේ ය.

(4) නඩුව විභාග කිරීමේ දී අධිකරණය විසින් වෙනත් යම් බලය කට හානියක් නොමැතිව—

(අ) අයිතිකරුට සියලු බඩු එපරිද්දෙන්ම භාරදීම සඳහා ආඥාවක් කළ හැකි ය ; නැතහොත්

(ආ) අයිතිකරුට සියලු බඩු එපරිද්දෙන්ම භාරදීම සඳහා ආඥාවක් කොට—

(i) කුලියට ගන්නාගේ හෝ ඇපකරුගේ වත්කම් සහ වෙනත් යම් අදාළ අවස්ථානුගත කරුණු කෙරෙහි නිසි සැලකිල්ල ඇතිව සාධාරණ යයි අධිකරණය

කල්පනා කරන කාලවල දී සහ මුදල් ප්‍රමාණවලින් කුලී සින්නක්කර මිලෙහි නොගෙවන ලද ශේෂය කුලියට ගන්නා විසින් හෝ ඇපකරු විසින් ගෙවනු ලැබිය යුතු බවට වූ කොන්දේසිය මත ; සහ

(ii) සාධාරණ යයි අධිකරණය කල්පනා කරන වෙනත් කොන්දේසි කුලියට ගන්නා විසින් හෝ ඇපකරු විසින් ඉටු කරනු ලැබීමට යටත්ව

ආඥාව ක්‍රියාත්මක වීම කල් තැබිය හැකි ය ; නැතහොත්

(ඇ) බඩුවලින් කොටසක් අයිතිකරුට එපරිද්දෙන්ම භාරදීම සඳහා සහ බඩුවල ඉතිරි කොටසට අයිතිකරුට ඇති හිමිකම කුලියට ගන්නාට පැවරීම සඳහා ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) කුලී සින්නක්කර මිල වෙනුවෙන් කුලියට ගන්නා විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය, කුලී සින්නක්කර මිලෙහි නොගෙවන ලද ශේෂය යටත් පිරිසෙයින් සියයට හැත්තෑ පහකින් ((8) වන උප වගන්තියට අනුකූලව තීරණය කරන ලද) බඩුවල කොටසක මිල ඉක්මවන බවට, අධිකරණය සෑහීමට පත් වන්නේ නම් මිස, බඩු වල ඒ කොටස සම්බන්ධයෙන් අයිතිකරුගේ හිමිකම කුලියට ගන්නාට පවරන්නා වූ ආඥාවක් අධිකරණය විසින් කරනු නොලැබිය යුතු ය.

(6) නඩු කටයුත්තේ දී අයිතිකරුට විරුද්ධව අලාභ ප්‍රදානය කොට ඇති අවස්ථාවක, සැබවින් ගෙවන ලද මුදල් ප්‍රමාණයට අතිරේකව කුලියට ගන්නා විසින් කුලී සින්නක්කර මිල සම්බන්ධ යෙන් අලාභයේ මුදල් ප්‍රමාණය හෝ සුදුසු යයි අධිකරණය විසින් කල්පනා කරනු ලබන අලාභයේ කොටසක් හෝ ගෙවා ඇති ලෙස අධිකරණය විසින් සලකනු ලැබිය හැකි අතර, එවිට ඒ අනුව අලාභය සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් අඩු කරනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියෙහි සහ මේ පනතේ වෙනත් යම් තැනක "යම් බඩු එපරිද්දෙන්ම භාරදීම සඳහා ආඥාව" යන්නෙන් කුලියට ගන්නාට ඒවායේ වටිනාකම ගෙවීමේ මනාපය දීමක් නො මැතිව අයිති කරුට බඩු භාරදීම සඳහා වූ ආඥාවක් අදහස් වේ.

(8) යම් බඩු සම්බන්ධයෙන් වන විට මේ වගන්තියෙහි "මිල" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුමේ සටහනින් හෝ සටහන් පත්‍රයෙන් එම බඩුවලට වෙන් කර දෙන ලද කුලී සින්නක්කර මිලෙන් කොටස හෝ එවැනි වෙන්කර දීමක් කරනු ලැබ නො මැති නම් අධිකරණය විසින් තීරණය කරනු ලබන කුලී සින්නක්කර මිලෙන් කොටස හෝ අදහස් වේ.

(9) මේ වගන්තිය අදාළ වන නඩුවක් විභාග කිරීමට පෙර යම් අවස්ථාවක අයිතිකරු විසින් බඩුවලින් කොටසක සන්තකය ආපසු ලබාගෙන ඇත්නම්, (4) වන උපවගන්තියෙහි සියලු බඩු සම්බන්ධ යෙන් කරන ලද සඳහන් කිරීම් අයිතිකරු විසින් ආපසු ලබා ගෙන නොමැතිව සියලු බඩු සම්බන්ධයෙන් කරන ලද සඳහන් කිරීම් ලෙස තේරුම් ගත යුතු ය. තවද එසේ ආපසු ලබා ගන්නා ලද බඩු සම්බන්ධයෙන් වූ කුලී සින්නක්කර මිල ගැලපීම සම්බන්ධ

යෙන් පාර්ශ්වකරුවන් එකඟත්වයට පැමිණ නොමැති නම්, ඒ උප වගන්තියෙහි (ආ) සහ (ඇ) ඡේදවල කාර්ය සඳහා කුලී සින්නක්කර මිල සහ එහි නොගෙවන ලද ශේෂය සම්බන්ධයෙන් සාධාරණ යයි අධිකරණය කල්පනා කරනු ලබන අඩු කිරීමක් අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය.

(10) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙන ලද බඩුවලින් කොටසක් අයිතිකරුවකු විසින් ආපසු ලබාගෙන ඇත්තා වූ ද ඒ ආපසු ලබා ගැනීම 20 වන වගන්තිය කඩ කරමින් ක්‍රියාත්මක කරනු ලැබ ඇත්තා වූ ද අවස්ථාවක, බඩුවල ඉතිරි කොටස ආපසු ලබා ගැනීමට අයිතිකරු විසින් පවරන ලද යම් නඩුවක් සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

22. කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ බඩු කුලියට දෙනු ලැබ, කුලී සින්නක්කර මිලෙන් සියයට හැත්තෑපහක් ගෙවීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් පසු යම් අවස්ථාවක, එම බඩු සම්බන්ධව කුලියට ගන්නා සමග අයිතිකරු විසින් වැඩිදුර කුලී සින්නක්කර ගිවිසුමක් සාදනු ලබන අවස්ථාවක, එම වැඩිදුර ගිවිසුමේ ආරම්භයේ සිට 20 වන සහ 21 වන වගන්තිවල විධිවිධාන ඒ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

එකම පාර්ශ්වකරුවන් අතර වූ අනුයාත කුලී සින්නක්කර ගිවිසුම්වලට 20 වන සහ 21 වන වගන්ති අදාළ කිරීම.

23. (1) අයිතිකරුට එපරිද්දෙන් ම බඩු භාර දීම සඳහා වූ ආඥාවක ක්‍රියාත්මක වීම 21 වන වගන්තිය යටතේ කල් තබා ඇති අතරතුර, කුලී සින්නක්කර ගිවිසුම යටතේ සහ එහි නියමයන් ප්‍රකාර බඩුවල සන්තකය කුලියට ගන්නාට ඇති ලෙස සලකනු ලැබිය යුතු ය:

බඩු භාරදීම සඳහා වූ ආඥාවක් අත් හිටුවීමේ ප්‍රතිඵලය.

එසේ වුව ද—

(අ) ආඥාවේ නියමයන්ට අනුකූලව හැර, කුලී සින්නක්කර මිලෙහි නොගෙවන ලද ශේෂය වෙනුවෙන් කුලියට ගන්නා විසින් හෝ ඇපකරුවකු විසින් හෝ තවදුරටත් කිසිම මුදලක් ගෙවනු නොලැබිය යුතු ය. නැතහොත් ගෙවනු ලැබිය යුතු නොවිය යුතු ය; තව ද

(ආ) ගෙවීමේ නියමයන් පිළිබඳ වෙනස් කිරීම් කෙරෙහි සැලකිල්ල ඇතිව අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන කුලී සින්නක්කර ගිවිසුමේ සහ ඊට අදාළ යම් ඇප ගිවිසුමක නියමයන් අධිකරණය විසින් තවදුරටත් මඳ වශයෙන් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) අයිතිකරුට එපරිද්දෙන් ම බඩු භාරදීම සඳහා වූ ආඥාවක ක්‍රියාත්මක වීම 21 වන වගන්තිය යටතේ කල් තබා ඇති අතර තුර කුලියට ගන්නා විසින් හෝ ඇපකරුවකු විසින්—

(අ) කල් තැබීම පිළිබඳ යම් කොන්දේසියක් හෝ අධිකරණය විසින් වෙනස් කරන ලද පරිදි ගිවිසුමේ යම් නියමයක් අනුව කටයුතු කිරීම පැහැර හරිනු ලැබුවහොත්; හෝ

(ආ) බඩු අයුතු ලෙස නීයාදනය කරනු ලැබුවහොත්;

ඒ ආඥාව කරනු ලැබුවේ යම් අධිකරණයක් විසින් ද, ඒ අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හැර අන්‍යාකාරයකින් කුලියට ගන්නාට හෝ ඇපකරුට විරුද්ධව පැහැර හැරීම හෝ නියාදනය කිරීම සම්බන්ධයෙන් අයිතිකරු විසින් කිසිම සිවිල් නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය:

එසේ වුව ද කුලී සින්නක්කර මිලෙහි නොගෙවන ලද ශේෂය ගෙවීමට අදාළ යම් කොන්දේසියක් කඩ කරන අවස්ථාවක, ආඥාව ක්‍රියාවේ යෙදවීමට අවසර ලබා ගැනීම සඳහා අයිතිකරු විසින් අධිකරණය වෙත ඉල්ලීමක් කළ යුතු බවට අධිකරණය විධාන කොට ඇත්නම් මිස, ඔහු විසින් එසේ කිරීමට අවසර ඉල්ලීම අවශ්‍ය නොවන්නේ ය.

(3) කුලී සින්නක්කර මිලෙහි නොගෙවන ලද ශේෂය ආඥාවේ නියමයන්ට අනුකූලව ගෙවනු ලැබ ඇති විට, බඩු සම්බන්ධයෙන් අයිතිකරුගේ හිමිකම කුලියට ගන්නා කෙරෙහි සතු විය යුතු ය.

(4) එවැනි යම් ආඥාවක ක්‍රියාත්මක වීම 21 වන වගන්තිය යටතේ කල් තබා ඇති කාලය තුළ යම් අවස්ථාවක අධිකරණය විසින්—

(අ) කල් තැබීමේ කොන්දේසි වෙනස් කිරීම සහ ඒ කල් තැබීමේ කොන්දේසි වෙනස් කිරීම කෙරෙහි සැලකිල්ල ඇතිව අවශ්‍ය යයි අධිකරණය විසින් සලකනු ලබන පරිදි කුලී සින්නක්කර ගිවිසුම සහ ඊට අදාළ යම් ඇප ගිවිසුමක් තවදුරටත් මඳ වශයෙන් වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය;

(ආ) කල් තැබීම ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය;

(ඇ) අයිතිකරුට බඩුවලින් කොටසක් එපරිද්දෙන් ම භාරදීම සඳහා සහ බඩුවල ඉතිරි කොටසට වූ අයිතිකරුගේ හිමිකම කුලියට ගන්නාට පැවරීම සඳහා 21 වන වගන්තියේ විධිවිධානවලට අනුකූල ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(5) 21 වන වගන්තිය අදාළ වන යම් නඩුවක දී ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ ආඥාවක ක්‍රියාත්මක වීම කල් තැබීම සඳහා වූ කොන්දේසි සම්බන්ධයෙන් අර්පණයක් කුලියට ගන්නා විසින් කරනු ලැබ, අධිකරණයේ අනුමතය ඇතිව අයිතිකරු විසින් පිළිගනු ලැබුවහොත්, එවිට එම ඡේදයේ සඳහන් කාරණා සම්බන්ධයෙන් සාක්ෂි විභාග නො කොට එකී අර්පණයට අනුකූලව අධිකරණය විසින් එම ඡේදය යටතේ ආඥාවක් කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද ඇපකරුවකු නඩුවේ පාර්ශ්වකරුවකු වන අවස්ථාවක, නඩුව විභාග කිරීම සඳහා නියම කරන ලද දිනයට පෙර එවැනි කිසිම ආඥාවක් කරනු නොලැබිය යුතු ය.

පිටපත් සහ තොරතුරු සැපයීමට අයිතිකරුගේ බැඳීම.

24. (1) ඇප ගිවිසුමක් ඇති අවස්ථාවක, අයිතිකරු විසින් අත්සන් කරන ලද කුලී සින්නක්කර ගිවිසුමේ සත්‍ය පිටපතක්, ගිවිසුම යටතේ අවසාන ගෙවීම කරනු ලැබීමට පෙර යම් අවස්ථාවක, ඇපකරු විසින් ඉල්ලනු ලැබූ විට, ගාස්තුවක් නොමැතිව සැපයීම අයිතිකරුගේ කාර්යය වන්නේ ය.

(2) තව ද, කුලී සින්නක්කර ගිවිසුම යටතේ අවසාන ගෙවීම කරනු ලැබීමට පෙර යම් අවස්ථාවක, තත්කාර්යය සඳහා කුලියට ගන්නාගෙන් ලියවිල්ලකින් වූ ඉල්ලීමක් අයිතිකරුට ලැබීමෙන් සහ වියදම් සඳහා රුපියලක මුදලක් කුලියට ගන්නා විසින් අයිති කරු වෙත ඉදිරිපත් කිරීමෙන් පසු දින දහහතරක් ඇතුළත—

(අ) කුලියට ගන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණය ;

(ආ) ගිවිසුම යටතේ අයවිය යුතු එහෙත් නොගෙවා ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය සහ එක් එක් නොගෙවන ලද වාරිකය අය විය යුතු වූ දිනය සහ එක් එක් වාරිකයේ මුදල් ප්‍රමාණය ; සහ

(ඇ) ගිවිසුම යටතේ ගෙවනු ලැබිය යුතු මුදල් ප්‍රමාණය සහ එක් එක් ඉදිරි වාරිකය ගෙවිය යුතු දිනය හෝ දිනය තීරණය කිරීමේ ක්‍රමය සහ ඒ එක් එක් වාරිකයේ මුදල් ප්‍රමාණය

දැක්වෙන, අයිතිකරු විසින් හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් හෝ අත්සන් කරන ලද, ප්‍රකාශයක් කුලියට ගන්නාට සැපයීම අයිති කරුගේ කාර්යය වන්නේ ය.

(3) (1) වන උපවගන්තියෙන් හෝ (2) වන උපවගන්තියෙන් නියම කරන ලද කාර්ය ක්‍රියාත්මක කිරීමෙහි ලා යුක්තිසහගත හේතුවක් නොමැතිව පැහැර හැරීමක් කර ඇති අවස්ථාවක, එවිට පැහැර හැරීම නොකඩවා කර ගෙන යන අතරතුර—

(අ) කුලියට ගන්නාට විරුද්ධව ගිවිසුම බලාත්මක කිරීමට හෝ ගිවිසුමට අදාළ යම් ඇප ගිවිසුමක් බලාත්මක කිරීමට හෝ කුලියට ගන්නාගෙන් බඩු ආපසු ලබාගැනීමට යම් අයිතිවාසි කමක් බලාත්මක කිරීමට හෝ අයිතිකරුට හිමිකම නො තිබිය යුතු ය ; තව ද

(ආ) ගිවිසුම යටතේ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් කුලියට ගන්නා විසින් දෙන ලද කිසිම ඇපයක් හෝ ඉහත කී පරිදි ඇප ගිවිසුමක් යටතේ ගෙවිය යුතු මුදල් සම්බන්ධයෙන් ඇපකරුවකු විසින් දෙන ලද කිසිම ඇපයක් එහි යම් දරන්නකු විසින් කුලියට ගන්නාට හෝ ඇපකරුට විරුද්ධව හෝ බලාත්මක කළ නොහැකි විය යුතු ය.

තව ද පැහැර හැරීම මාස දෙකක කාලයක් නොකඩවා කරගෙන යනු ලබන්නේ නම් රුපියල් දෙසියය දක්වා ව්‍යාප්ත විය හැකි දඩයකින් අයිතිකරුට දඬුවම් කරනු ලැබිය යුතු ය.

(4) කුලී සින්නක්කර ගිවිසුමෙන් ආවරණය වූ බඩු යටත් වූ යම් සෘණභාරයක් හෝ බැඳීමක් අයිතිකරුට හෝ කුලියට ගන්නාට විරුද්ධව හෝ අයිතිකරු සහ කුලියට ගන්නා යන දෙදෙනාටම විරුද්ධව හෝ බලාත්මක කිරීමට තෘතීය පාර්ශ්වකරුවකුගේ අයිතිවාසිකම කෙරෙහි බලපාන්නක් ලෙස (3) වන උපවගන්තියෙහි කිසිවක් තේරුම් නොගත යුතු ය.

මුදල් ගෙවීමෙන් හැර අන්‍යාකාරයකින් මිලෙන් නිදහස් වීම.

25. මුදල් ගෙවීමෙන් හැර අන්‍යාකාරයකින් කුලී සින්නක්කර මිලෙහි යම් කොටසක් නිදහස් කරනු ලැබිය හැකි බවට අයිතිකරු එකඟව ඇති අවස්ථාවක, එවැනි යම් නිදහස් කිරීමක්, මේ පනතේ කාර්ය සඳහා කුලී සින්නක්කර මිලෙහි එම කොටස ගෙවීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

කුලියට ගන්නා ආදීන් වස්තු සංගත්වයට පත් වීම.

26. (1) කුලී සින්නක්කර ගිවිසුම නොකඩවා පවත්නා කාලය තුළ වස්තු සංගත්වයට පත් වීම සම්බන්ධයෙන් තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ, කුලියට ගන්නා වස්තු සංගත්වයට පත්වූවකු ලෙස විනිශ්චය කරනු ලැබූ අවස්ථාවක, ගිවිසුම යටතේ කුලියට ගන්නා සන්තකයෙහි ඇති බඩු සම්බන්ධයෙන් කුලියට ගන්නාට තිබූ අයිතිවාසිකම් සහ බැඳීම් පැවරුම් ලාභියාට තිබිය යුතු ය.

(2) පැවරුම් ලාභියා විසින්, දිසා අධිකරණයේ අවසරය ඇතිව ගිවිසුම යටතේ කුලියට ගන්නා සතු වූ අයිතිවාසිකම් සහ බැඳීම් වෙනත් යම් තැනැත්තකුට පවරා දෙනු ලැබිය හැකි ය. තවද ගිවිසුම යටතේ කුලියට ගන්නා සතු වූ සියලු අයිතිවාසිකම් පැවරුම් ලාභියාට තිබිය යුතු අතර, ගිවිසුම යටතේ කුලියට ගන්නා සතු වූ සියලු බැඳීම්වලට ඔහු යටත් විය යුතු ය.

බඩුවල සන්තකය ආපසු ලබා ගැනීම සඳහා වූ සිවිල් නඩුවක දී හෝ ඉල්ලීමක දී අහිතකර ලෙස රඳවා තැබීම පිළිබඳව සාක්ෂි.

27. කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙන ලද බඩුවල අයිතිකරුවකු විසින් කුලියට ගන්නාගෙන් බඩුවල සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිවාසිකමක් බලාත්මක කිරීම පිණිස වූ සිවිල් නඩුවක දී හෝ ඉල්ලීමක දී ඒ සිවිල් නඩුව හෝ ඉල්ලීම ආරම්භ කිරීමට පෙර සහ බඩුවල සන්තකය ආපසු ලබා ගැනීමේ අයිතිවාසිකම උපචිත වූ පසු, බඩු පවාරණය කිරීමට අයිතිකරු විසින් කුලියට ගන්නාට ලියවිල්ලකින් වූ ඉල්ලීමක් කළ බව අයිතිකරු විසින් ඔප්පු කරනු ලැබ ඇති අවස්ථාවක, බඩුවල සන්තකය ආපසු ලබා ගැනීමට අයිතිකරුගේ හිමිකම් පෑමේ කාර්යය සඳහා, කුලියට ගන්නා විසින් බඩු සන්තකයට ගෙන තිබීම නීති විරෝධී ලෙස සලකනු ලැබිය යුතු ය.

දැන්වීම් ආදිය භාරදීම.

28. (1) මේ පනත යටතේ අයිතිකරුවකුට හෝ කුලියට ගන්නකුට හෝ ඇපකරුවකුට භාරදීමට හෝ දීමට හෝ යැවීමට නියම කරන ලද හෝ බලය දෙන ලද යම් දැන්වීමක් හෝ ලේඛනයක්—

(අ) ඔහු වෙත පෞද්ගලිකව එය භාරදීමෙන් ;

(ආ) අවසන්වරට දැන සිටි ඔහුගේ පදිංචි හෝ ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එය යැවීමෙන් ; හෝ

(ඇ) අවසන්වරට දැන සිටි ඔහුගේ පදිංචි හෝ ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට සාමාන්‍ය තැපැල් මගින් එය යැවීමෙන් සහ තැපැල් කිරීමේ සහතිකයක් ලබා ගැනීමෙන්

එසේ භාරදීම, දීම හෝ යැවීම කරනු ලැබිය හැකි ය.

(2) යම් දැන්වීමක් හෝ ලේඛනයක් භාරදීමට හෝ දීමට හෝ යැවීමට නියම කරනු ලැබුවේ හෝ බලය දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා සංස්ථාවක්, මණ්ඩලයක්, පොදු මණ්ඩලයක් හෝ සමාගමක් වන අවස්ථාවක, එවැනි සංස්ථාවලට සිතාසි භාරදීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයෙන් ඒ දැන්වීම හෝ ලේඛනය භාර දෙනු ලැබිය හැකි ය.

කුලී සින්නක්කර ගිවිසුම්වල ඇතැම් විධිවිධාන බලරහිත කිරීම.

29. කුලී සින්නක්කර ගිවිසුමක ඇති පහත දැක්වෙන විධිවිධාන, එනම්—

(අ) කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට දෙනු ලැබ ඇත්තා වූ බඩු සන්තකයට ගැනීමේ කාර්යය සඳහා කුලියට ගන්නා පදිංචිව සිටින ස්ථානයට අයිතිකරුවකුට හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තකුට ඇතුලුවීමට බලය දෙන්නා වූ හෝ එවැනි යම් ඇතුලුවීමක් සම්බන්ධ බැඳීමෙන් ඔවුන් නිදහස් කරන්නා වූ; හෝ

(ආ) කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමට මේ පනතින් කුලියට ගන්නකු වෙත පවරන ලද අයිතිවාසිකම බැහැර කරනු ලබන්නා වූ හෝ සීමා කරනු ලබන්නා වූ නැතහොත් මේ පනතින් නියම කරන ලද බැඳීමට අතිරේකව මේ පනත යටතේ කුලියට ගන්නකු විසින් කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමේ හේතුවෙන් කුලියට ගන්නකුට යම් බැඳීමක් නියම කරනු ලබන්නා වූ; හෝ

(ඇ) කවර වූ යම් ආකාරයකින් කුලී සින්නක්කර ගිවිසුම අවසන් කිරීමෙන් පසු, මේ පනත යටතේ ඔහු විසින් ගිවිසුම අවසන් කරනු ලැබුවේ නම් ඔහු යටත් විය යුතුව තිබූ බැඳීම ඉක්මවන්නා වූ බැඳීමකට කුලියට ගන්නකු යටත් කරන්නා වූ; හෝ

(ඈ) කුලී සින්නක්කර ගිවිසුමක් ඇති කිරීම හෝ සමාප්ත කිරීම සම්බන්ධයෙන් අයිතිකරුවකු හෝ විකුණුම්කරුවකු වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු කුලියට ගන්නාගේ හෝ මිල දී ගන්නාගේ අනුයෝජිතයා වශයෙන් සලකන්නා වූ හෝ එලෙස සලකනු ලබන්නා වූ; හෝ

(ඉ) කුලී සින්නක්කර ගිවිසුමක් ඇති කිරීම හෝ සමාප්ත කිරීම සම්බන්ධයෙන් තමා වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකුගේ ක්‍රියා හෝ පැහැර හැරීම් සම්බන්ධයෙන් වූ බැඳීමෙන් අයිතිකරුවකු හෝ විකුණුම්කරුවකු නිදහස් කරන්නා වූ; හෝ

(ඊ) අයිතිකරු සහ කුලියට ගන්නා හෝ මිල දී ගන්නා අතර අන්‍යෝන්‍ය එකඟත්වයෙන් තෝරා ගන්නා ලද තැනැත්තකු නොවන තැනැත්තකුගේ සේවාවන් රක්ෂකයකු වශයෙන් හෝ අලුත් වැඩියා කරන්නකු වශයෙන් හෝ කවර වූ වෙනත් තත්ත්වයකින් හෝ ප්‍රයෝජනයට ගැනීමට කුලියට ගන්නකුට හෝ මිලට ගන්නකුට නියම කරන්නා වූ

යම් විධිවිධානයක් බලරහිත විය යුතු ය.

නියෝග.

30. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින සිට හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තවද, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එකී අනනුමතියේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

31. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුම" යන්නෙන්—

(අ) ගැනුම් මිල හෝ ඉන් කොටසක් වාරිකවලින් ගෙවනු ලැබිය යුතු වූ; සහ

(ආ) වාරික ගෙවීම හෝ අන්‍යාකාරයක් පිළිබඳව ගිවිසුමේ සඳහන් කරනු ලබන කොන්දේසි ඉටු කරනු ලබන තෙක් (බඩුවල සන්තකය මිල දී ගන්නාට තිබුණ ද) බඩුවල දේපළ විකුණුම්කරු වෙත ඉතිරිව තිබිය යුතු වූ,

බඩු විකිණීම සඳහා වූ, ගිවිසුමක් අදහස් වේ;

යම් කුලී සින්නක්කර ගිවිසුමක් සම්බන්ධයෙන් වන විට "ඇප ගිවිසුම" යන්නෙන් (මේ පනතෙහි "ඇපකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින් කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලියට ගන්නාගේ සියළු බැඳීම් හෝ ඉන් කිසිවක් ඉටු කිරීම සහතික කරන්නා වූ ගිවිසුමක් අදහස් වේ;

"අධිකරණය" යන්නෙන් සිවිල් නඩුව හෝ නඩුව භාර ගැනීමට අධිකරණ බලය ඇත්තා වූ අධිකරණය අදහස් වේ;

"ඇපකරු" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලියට ගන්නකු විසින් ඔහුගේ සියලු බැඳීම් හෝ ඉන් කිසිවක් ඉටු කරනු ලැබීම සහතික කර ඇත්තා වූ තැනැත්තෙක් අදහස් වේ;

"කුලිය" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලියට ගන්නා විසින් කලින් කල ගෙවිය යුතු මුදල අදහස් වේ;

"කුලී සින්නක්කර ගිවිසුම" යන්නෙන් යම් ගිවිසුමක් යටතේ බඩු කුලියට දෙනු ලබන්නේ ද—

(අ) යම් තැනැත්තකු විසින් එකඟ වූ මුදල් ප්‍රමාණයක් කාලීන වාරිකවලින් ගෙවනු ලබන බවට වූ කොන්දේසිය මත බඩුවල අයිතිකරු විසින් ඒ තැනැත්තාට බඩුවල සන්තකය භාර දෙනු ලබන්නේද;

(ආ) (i) ගිවිසුමේ නියමවලට අනුකූලව බඩු මිලදී ගැනීමේ මනාපය කුලියට ගන්නාට ඇත්තේ ද; නැතහොත්

(ii) ඒ වාරිකවලින් අවසාන වාරිකය ගෙවීම මත බඩුවල දේපළ කුලියට ගන්නාට සංක්‍රමණය වන්නේ ද

ඒ ගිවිසුම අදහස් වන අතර, කොන්දේසි සහිත විකිණීමේ ගිවිසුමක් ඊට ඇතුළත් වේ. එහෙත් ගිවිසුමට ඇතුළත් වන අවස්ථාවේ දී හෝ බඩු භාර දීම මත හෝ භාර දීමට පෙර යම් අවස්ථාවක ගිවිසුමෙහි ඇතුළත් බඩුවල දේපළ සංක්‍රමණය වන්නා වූ යම් ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ;

"කුලී සින්නක්කර මිල" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුම අදාළ වන්නේ යම් බඩුවලට ද ඒ බඩු මිලට ගැනීම හෝ ඒ බඩුවල දේපළ අත්කර ගැනීම සම්පූර්ණ කිරීම පිණිස කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ කුලියට ගන්නා විසින් ගෙවිය යුතු මුළු මුදල අදහස් වන අතර, අයිතිකරුට හෝ වෙනත් යම් තැනැත්තකුට ගෙවනු ලැබිය යුතු වුවද නැතහොත් ගෙවනු ලැබුව ද නැතහොත් මුදල් ගෙවීමෙන් හෝ බඩු පැවරීමෙන් හෝ භාර දීමෙන් හෝ වෙනත් යම් ක්‍රමවලින් නිදහස් කරනු ලැබිය යුතු වුව ද නැතහොත් නිදහස් කරනු ලැබුව ද, තැන්පතුවක හෝ වෙනත් මූලික ගෙවීමක ආකාරයෙන් හෝ එවැනි යම් තැන්පතුවක් හෝ ගෙවීමක් හේතුකොට ගෙන කුලියට ගන්නාට බැරකරන ලද හෝ බැරකරනු ලැබිය යුතු වූ ද කුලී සින්නක්කර ගිවිසුම යටතේ කුලියට ගන්නා විසින් එසේ ගෙවිය යුතු වූ ද යම් මුදලක් ඊට ඇතුළත් වේ. එහෙත් ගිවිසුම කඩකිරීමක් සඳහා දණ්ඩනයක් වශයෙන් හෝ වන්දි වශයෙන් හෝ අලාභ වශයෙන් හෝ ගෙවිය යුතු යම් මුදලක් ඊට ඇතුළත් නොවේ;

"කුලියට ගන්නා" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ අයිතිකරුවකුගෙන් බඩුවල සන්තකය ලබා ගන්නා වූ හෝ ලබාගෙන ඇත්තා වූ තැනැත්තා අදහස් වන අතර, ගිවිසුම යටතේ කුලියට ගන්නාගේ අයිතිවාසිකම් හෝ බැඳීම් පවරා දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් සංක්‍රමණය වනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ;

"සවි කිරීමේ ගාස්තු" යන්නෙන්—

(අ) ගිවිසුමට අදාළ බඩු, ඒවා පාවිච්චි කරනු ලබන ස්ථානයෙහි සවි කිරීම සහ එවැනි යම් බඩු එහි පාවිච්චි කරනු ලැබීමට හැකි කරනු පිණිස ඒ ස්ථානය වෙනස් කිරීම ; සහ

(ආ) එවැනි යම් බඩු පාවිච්චි කරනු ලැබිය යුතු ස්ථානයෙහි ඒ බඩු ඉදි කිරීම හෝ ගොඩ නැංවීම යුක්තිසහගත ලෙස අවශ්‍ය වන අවස්ථාවක ඒ ඉදි කිරීමේ හෝ ගොඩ නැංවීමේ කාර්යය සඳහා ක්‍රියාත්මක කරන ලද යම් වැඩක්

සම්බන්ධයෙන් අයිතිකරු විසින් දරන ලද යම් වියදම් අදහස් වේ ;

"අයිතිකරු" යන්නෙන් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ බඩු කුලියට දෙන්නා වූ හෝ බඩු විකිණීමට එකඟ වන්නා වූ තැනැත්තා අදහස් වන අතර, ගිවිසුම යටතේ අයිතිකරුගේ බඩුවල දේපළ හෝ අයිතිකරුගේ අයිතිවාසිකම් වලින් හෝ බැඳීම්වලින් කිසිවක් පවරා දීමෙන් හෝ නීතිය ක්‍රියාත්මක වීමෙන් සංක්‍රමණය වී ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා ද ඊට ඇතුළත් වේ ;

"තෘතීය පාර්ශ්ව රක්ෂණය" යන්නෙන් රක්ෂණ කිරීම නීතියෙන් නියම කරනු ලැබ ඇත්තා වූ මෝටර් වාහනයක් පාවිච්චි කිරීමෙන් සිදු වූ හෝ ඉන් උද්ගත වන්නා වූ මරණය හෝ කායික පීඩා සම්බන්ධයෙන් වූ බැඳීමට අදාළ යම් රක්ෂණය කිරීමක් අදහස් වේ ;

"වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු" යන්නෙන් රක්ෂණ කිරීම සඳහා ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් හැර මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම සහ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් නීතිය යටතේ කුලියට ගන්නා විසින් හෝ ඔහු වෙනුවෙන් ගෙවීම සඳහා අයිතිකරු විසින් කුලී සින්නක්කර ගිවිසුමක් යටතේ සලස්වනු ලැබිය යුතු යම් මුදල් ප්‍රමාණයක් අදහස් වේ.

## උපලේඛනය

### කුලී සින්නක්කර ගිවිසුම්වල ඇතුළත් කිරීම සඳහා දැන්වීම

........................................................................

........................................................ (බඩු පිළිබඳ කෙටි විස්තරයක්) ට අදාළ යෝජිත කුලී සින්නක්කර ගිවිසුම යටතේ ඔබගේ මූල්‍ය බැඳීම් පිළිබඳ සාරාංශය.

1. බඩුවල අත්පිට මිල රු. ........................

සවි කිරීමේ ගාස්තුව රු. ............

එකතුව රු. ........................

2. ව්‍යවස්ථාපිත ගාස්තුව සහ රු. ............... ක තැන්පතුව ඇතුළත් කුලී සින්නක්කර මිල රු. ........................

3. පහත දැක්වෙන මුදල් ප්‍රමාණයන් කුලී සින්නක්කර මිලෙහි ඇතුළත් කොට ඇත—

(අ) වාහන කුලිය (බඩු හෝ ඉන් කිසිවක් කුලියට ගන්නාට හෝ ඔහුගේ අණට භාරදීමේ වියදම්) රු. ........................

(ආ) යම් නීතියක් යටතේ ගෙවිය යුතු ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ වෙනත් ගාස්තු රු. ........................

(ඇ) රක්ෂණය රු. ........................

(ඈ) සවි කිරීමේ ගාස්තු රු. ........................

(ඉ) ව්‍යාපාර පිරිවැටුම් බද්ද හෝ වෙනත් බදු රු. ........................

4. ගෙවිය යුතු වාරික සහ ඒ වාරික ගෙවිය යුතු කාල පරාසය පහත දැක්වේ:—

5. අයිතිකරුගේ ලිඛිත කැමැත්ත ඇතිව, කුලී සින්නක්කර ගිවිසුම යටතේ වූ ඔබගේ අයිතිවාසිකම් ඔබ විසින් පවරා දෙනු ලැබිය හැකි අතර ඔහුගේ කැමැත්ත අයුක්තිසහගත ලෙස ඔහු විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය නොහැකිය.

6. 1982 පාරිභෝගික ණය පනතේ 8 වන වගන්තිය ප්‍රකාර වූ ප්‍රතිදානයක් ඇතිව යම් අවස්ථාවක බඩු මිලට ගැනීමට ඔබට අයිතිවාසිකම ඇත.

7. 1982 පාරිභෝගික ණය පනතේ 9 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඔබගේ වියදමින් අයිතිකරු වෙත බඩු ආපසු භාර දීමෙන් කුලී සින්නක්කර ගිවිසුම කිසියම් අවස්ථාවක අවසන් කිරීමට ඔබට අයිතිවාසිකම ඇත.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (දේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.